රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2006 (II)

මගේ අංකය: EST-3/DICIP/06/0195
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.03.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**2013.10.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2006(I) මඟින් 2006.02.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2006 අනුව අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා ලබා දී තිබූ කාල සීමාව දීර්ඝ කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2006.02.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2006, 2013.10.31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2006(I) හා 2013.12.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි 04/2013 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 1983 ජූලි මාසයට පූර්වාසන්නයේ සහ ඉන්පසු 2009.05.18 දින දක්වා රටේ පැවති අයහපත් තත්ත්වය හේතුකොට ගෙන රැකියා අහිමි වූවන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2006(I) හි 02 ඡේදය මඟින් අභියාචනා කිරීමට ලබා දුන් කාලය 2017.12.31 දින දක්වා දීර්ඝ කිරීමට 2017.02.21 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2006 හෝ 04/2006(I)හි විධිවිධාන අනුව කාලය ඉකුත්වීම නිසා අභියාචනා ඉදිරිපත් කිරීමට නොහැකි වූ හෝ ඉදිරිපත් කළ අභියාචනා කාලය ඉකුත්වීම නිසා ප්‍රතික්ෂේප වූ අභියාචකයන්ගේ ඉල්ලීම් නැවත සලකා බැලිය හැකිවන අතර, ඉහත මුල් ඡේදයේ සඳහන් චක්‍රලේඛයන්හි අනෙකුත් විධිවිධාන තවදුරටත් එලෙසම බලපැවැත්වේ.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය